# ඉටි රටා මත වර්ණ ඇතිරූ

## අයිරාංගනී

ශිල්ප උගන්නට ඉගෙනුම් අවස්ථා, පාඨමාලා එතරම් සුලබ නොවූ 70 දශකය මැද භාගය වන විට සාම්ප්‍රදායික වෘත්තීන් කිහිපයක් විනා අන් කිසිවක් එතරම් ප්‍රචලිත නොවිණ. එබැවින් තමා උපන්හපන්කම් දැක් වූ චිත්‍ර කලාව, තමාගේ ජීවන ඉම තීරණය කරන ප්‍රමුඛ සාධකය වේ යැයි මද්දුම වෙල්ලාලගේ අයිරාංගනී කිසි විටෙක නොසිතුවාය. තම සිහින රැකියාව, ලිපිකරු වෘත්තිය කර ගත් ඈ ඊට අදාළ සුදුසුකම් සපුරා අයදුම්පත්‍ර ගණනාවක්ම යොමු කළත් ඒ එකක්වත් සාර්ථක නොවූ තැන හෙම්බත්ව හුන්නාය. ඒත් එක මොහොතකදී ඊට දෛවයෙන් ඇගේ හැකියාවට ඉඩහසර වෙන් විය. ඇගේ නැගණිය බතික් කර්මාන්ත ශාලාවක සම්මුඛ පරීක්ෂණයකට ගියත් ඇය ඉන් අසමත් වූවේ චිත්‍ර කලා හැකියාව ඇය වෙත නොවූ හෙයිනි. නැගණියගේ මඟපෙන්වීම මත එම සම්මුඛ පරීක්ෂණයෙන් සමත්ව බතික් නිර්මාණ ශිල්පිනියක ලෙස වෘත්තිය දිවිය ආරම්භ කළ ඕ ඉතිරි සියල්ලම දෛවයට බාර නොදුන්නා ය. සොයා යාමත්, හඹා යාමත්, වැටෙන හැමවිට නැඟී සිටින්නට තරම් ධෛර්යයෙන් යුක්ත වීමත් නිසා ඇගේ ධෛර්යයේ කතාව මෙසේ ලියැවේ.

පවරන දේ ඉටු කරනවා මිස ප්‍රශ්න නඟන්නට ඉඩක් නොවූ අයිරාංගනී දුටු දේ මතක තබා ගන්නට නොවූ බතික් කර්මාන්ත ශාලාවෙහි දවසේ කුලිය රුපියල් පහක් විය.

කාලයත් සමඟ විවිධ හැලහැප්පීම් නිසා කොළඹ නගරයට විතැන් වූ ඕ යළි ගාල්ලට එන්නේත්, යළි බතික් කර්මාන්ත ශාලාවේ සේවයට එන්නේත් විවාහ වීමත් සමඟය. ඒ 1983ය. මුල් කාලයේ චිත්‍ර ඇඳීම පමණක් කළ ඇය හට ඩයි දමන්නට, වැක්ස් කරන්නට ද ඉඩ ලැබිණ. පදිංචිය ගිංතොටටත්, යළි ගිංතොටින් හබරාදූවටත් වෙනස්

වීම, ගිංතොටදී ගංවතුරෙන් එල්ල වූ තර්ජන නිසා සියලු සන්තකයන් අහිමි වීම ආදී ඇදවැටීම් ඇගේ ගමන්මඟට බාධා කළත් ඉන් නැවතුණේ අයිරාංගනී නොවේ. මේ කාලයේ ඇයගේ මිතුරෙක් ඉල්ලීම් කළේ ගෙනවිත් දෙන රෙදි බතික් කර දෙන ලෙසය. ඒ පිළිබඳ සලකා බැලූ ඕ එහි යෙදෙන්නට නිර්භීත පියවරක් තැබුවාය. සැමියාගේ ඉතිරි කිරීමේ ගිණුමේ වූ රුපියල් දහසෙන් හත්සිය පනහක් ගෙන මූලික ප්‍රාග්ධනය ලෙස යෙදවූ අතර අත්‍යවශ්‍යම උපකරණ මිලට ගන්නට පමණක් එය සෑහිණ. ඉටි කරන රාමුව ලෙස භාවිත කළේ පොලු ගැලවූ නිදන ඇඳය. දරුවා නාවන බේසම පවා ව්‍යාපාරයේ වැඩට යෙදවිණ.

මේ කාලය වන විට විසල් නැග්මක් හෝ ඇදවැටීමක් නැති සරල රේඛීය ගමනක ව්‍යාපාරය දියත් වුණත් කුටුම්භයේ අවශ්‍යතා, සිහින නිවසක අරමුණු ඉටු කර ගන්නට ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවූ නිසා ව්‍යාපාරය තාවකාලිකව නවතා දැමූ ඇය මැද පෙරදිග රැකියාවකට ගියාය. එහි මාස තුනක්වත් නොරැඳී යළි ලංකාවට ආ ඇයට නව පණකින් ව්‍යාපාරය ආරම්භ කරන්නට එහිදී උපයා ගත් රියාල් 400ක මුදල ප්‍රමාණවත් විය. එම රුපියල් හයදහස් ගණන යොදවා මහන මැෂිමක් මිලට ගත් ඇය ජනසවියෙන් ගත් ණය මුදලක් ද යොදවා "ෂර්මිලා බතික්" ආරම්භ කළාය. ඒ 1991 වසරේදීය.

අතේ හුරුව හා හිතේ සවියෙන් යන ගමනක් වන මෙය සාර්ථක වන්නටනම් ව්‍යවසායකත්ව අවබෝධය, කළමනාකරණ දැනුම සමඟින් වෙළෙඳපොළ ප්‍රවාහය හා කරට කර සිටිය යුතු බව අයිරාංගනී තේරුම් ගත්තාය. අපනයන සංවර්ධන මණ්ඩලයේ පුහුණු වැඩසටහනකට අයදුම්පත්‍රයක් යොමු කෙරුණේ එහෙයිනි. එහෙත් පිළිතුරු ලැබුණේ ඇය ඊට තෝරා නොගැනුණු බවටය. එහෙත් එය අධෛර්යයට හේතුවක් කොට නොගත් අයිරාංගනීගේ දෙවැනි උත්සාහය සාර්ථක විය. ව්‍යවසායකත්වය යනු කුමක්ද? නිෂ්පාදන මිල කරන්නේ කෙසේද? වෙළෙඳපොළ තරගකාරීත්වය

තුළ නොවැටී සිටින්නේ කෙසේද? ආදී බොහෝ කරුණු ඇය උගත්තේ එහිදීය. ෂර්මිලා බතික් ව්‍යාපාරයේ මුදුන්මුල ඒ අයුරින් ශක්තිමත් වෙද්දී ඇය ප්‍රථම වරට ව්‍යවසායක ප්‍රදර්ශනයකට සහභාගි වන්නේ එහිදීය. මුදුන්මුල එසේ සවිමත් වෙද්දී තවත් අතුපතර විහිදන්නට ෂර්මිලා බතික් වෙත දෑත් දිගු කළේ ඇග්‍රොමාට් පදනමය. ඇග්‍රොමාට් පදනමේ උපදෙස් ද, ණය මුදල ද මනා සේ ආයෝජනය කළ අයිරාංගනී පදිංචි නිවසට යාබදව අඩි 15’ x20’ කාමරයක් ද සාදා ගත්තාය. ව්‍යාපාරයට සේවකයන් බඳවා ගත්තේ ද මේ කාලයේය. 1999 වසරේදී එම පදනම පැවැත්වූ ව්‍යවසායක තරගයකින් ප්‍රථම ස්ථානය දිනාගත් අයිරාංගනීට තායිලන්තයේ පුහුණු වැඩසටහනකට අවස්ථාව ලැබිණ. එයින් ලද ආභාසය ව්‍යාපාරයේ නිම්වළලු පුළුල් කරවන්නට හේතු විය. ස්වකීය අත්දැකීම්, අත්හදා බැලීම් පිළිබඳ විශ්වාසය උපරිම වුවත් තම ව්‍යවසායක අවබෝධය ගැන සෑහීමකට පත් නොවූ ඇය එය උපයා ගැනීම කෙරේ වැඩි අවධානය යොමු කළාය. අපනයන සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා මාස්ටර් ටේලර් සංගමය එක්ව 2008 දී සංවිධානය කරන ලද Advance Craft Tailoring පාඨමාලාව හැදෑරීම, බතික් නිෂ්පාදනවල ප්‍රමිතිය ගැන ඇයට තිබූ සැකසංකා දුරලන මඟක් විය. අපනයන මට්ටමට තම නිෂ්පාදන ඔසවා තබන්නටත් විදේශිකයන්ට තම නිෂ්පාදන හඳුන්වා දෙන්නටත් එයින් මඟ විවර විය. එමෙන්ම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් පැවැත්වූ අපනයනය ඉලක්ක කර ගත් ව්‍යවසාය සංවර්ධන වැඩසටහන්වලින් ලත් දැනුම් සම්භාරයන් මනා සේ ආයෝජනය කරමින් තම බතික් නිෂ්පාදන, විදේශිකයන් වෙත හඳුන්වා දුන්නාය. මේ වන විට ඇය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලත් නිෂ්පාදන ප්‍රමිතිය ඉහළ නැංවීමේ පුහුණුවකින් ද සන්නද්ධව සිටියාය. සරල, සැහැල්ලු ඇඳුම්වල මැවුණු බතික් රටා විදේශිකයන් අතර ප්‍රචලිත වන්නට වැඩි කල් ගතවූයේ නැත. සංචාරක කර්මාන්තයට තෝතැන්නක් බඳු කොග්ගල ප්‍රදේශයේ පදිංචිය

ඇයගේ මේ ගමනට මහත් සවියක් විය. නව නිර්මාණාත්මක ඇඟලුම්වලට රිසි වූ සංචාරකයන් ඇය සොයා නිවසටම පැමිණීම සුලබ කරුණක් විය. නිෂ්පාදන මිලට ගැනීම මෙන්ම ඉටි කරන්නට, රටා අඳින්නට මෙන්ම වර්ණ ගන්වන්නටත් රිසි වූ සංචාරකයන්ට එකී නැවුම් අත්දැකීම තම කර්මාන්තශාලාව තුළ ලබා දෙන්නට තරම් ඇය කාරුණික වූවාය. ඒ දෘශ්‍ය මතක සටහන් අතර ඇය අද නෙත් දිවවන්නේ මහත් ප්‍රීතියෙනි. මේ නිසාම කොග්ගල, හබරාදූව, හික්කඩුව ආදී ප්‍රදේශවල සංචාරක මහපෙන්වන්නන් ඇයට හිතමිතුරන් බඳුවිය. ව්‍යවසායකත්වයේදී භෞමික හා මානව සම්පත් ඵලදායී ලෙස යොදා ගැනීම මෙහිදී විශේෂයෙන්ම කැපී පෙනේ.

බතික් ඇඟලුම් නිෂ්පාදනය හා විකිණීම යන්නට පමණක් සීමා නොවූ අයිරාංගනීගේ ව්‍යාපාරය කවර තැනක රැඳුණත් නව දැනුම සොයා යාමේ හා අවස්ථාවන් හඹා යාමේ සාධාරණ උත්සාහයන් කිසි විටෙක අත්හළේ නැත. ඒ අනුව මුලදී සිහිනයක් වූ පුහුණු සහ වැඩමුළු සඳහා වන අවස්ථා ඇයට පසුකලෙක හිඟ නොවීය. ඒ කවරකදී වුව ඉගෙන ගන්නා සුළු කරුණු පවා අත්හදා බැලීම්වල දී භාවිත කරමින් ඒවා සංවිධානය කරන ආයතන හා අංශයන්ගේ උත්සාහයන්ට උපරිම සාධාරණය ඉටු කරන්නට ඇය අදටත් නොපැකිළව ක්‍රියාත්මක වන්නීය. බොහෝ පුහුණු අවස්ථා සහ වැඩමුළුවලට සහභාගි වුවත් ඒවා ක්‍රියාත්මක මට්ටමට ගෙන ඒමට නොසිතන බොහෝ ග්‍රාමීය කාන්තාවන්ට මෙයින් ඇය ලබා දෙන්නේ මහඟු ආදර්ශයකි. එකී සොයායෑම් තුළින් ඇය අත්පත් කර ගත් නව මානයන් බොහෝය. සාම්ප්‍රදායික බතික් මෝස්තර, වර්ණ යන පටු රාමුවෙන් මිදුණු අයිරාංගනී නව වර්ණ රටා, නව ඉටි රටා මෙන්ම නව නිෂ්පාදන සඳහා ද අත්හදා බැලීම්වල නිරත වූවාය. බතික් සාරි, සරම්වලින් ඔබ්බට ගොස් බතික් ඇතිරිලි, දොර හා ජනෙල් රෙදි ආදී ඉසව් කරා ද ඒවා ව්‍යාප්ත විය. සාම්ප්‍රදායික නිෂ්පාදන කිහිපයකට පමණක් හුරුව වුන් ගැනුම්කරුවන්ගේ ආකර්ෂණය මේ නිෂ්පාදනවලට නොමඳව හිමි විය. වෙළෙඳපොළ

අභියෝග ජය ගන්නට සාධාරණ උත්සාහයන් දරන ව්‍යවසායක භූමිකාවකට පණ පොවන ඕ ආරම්භයේ සිට මේ දක්වාම කටයුතු කරන්නේ, quality.Not quantity යන්න තේමා පාඨය කොට ගනිමිනි.

සාධාරණ හා නිත්‍යානුකූල ව්‍යවසායකත්වය දීර්ඝ ගමනකට හේතු වේ. පාරිසරික බලපත්‍රය ද ලබා සිටින ඕ ස්වකීය නිෂ්පාදනවලදී භාවිත කරන රසායනික ද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයන් නිසියාකාරව පිළිපැදීම ප්‍රශංසනීය වේ. එමෙන්ම රෙදි වර්ණ ගැන්වීමේදී එකම වර්ණයක් සකසා ගෙන ඊට අදාළ ඇණවුම් සියල්ල සඳහා එය භාවිත කිරීම ද උපරිම භාවිතයකින් පසු එම වර්ණ අවශේෂ බැහැර කිරීම ද නිසියාකාරව සිදු වේ. ඇයගේ මේ කළමනාකරණ හැකියාව ද ව්‍යවසායක භූමිකාවේ උන්නතිය උදෙසා හේතු වන්නට ඇති බව පැහැදිලිය. බතික් නිර්මාණ සඳහා බහුලව භාවිත වන්නේ කපු රෙදිය. ඒවා නැවත ප්‍රතිචක්‍රියකරණය කරමින් වෙනත් අවශ්‍යතා සඳහා භාවිත කළ හැකිය. කල්පැවැත්ම අතින් ද ඉහළය. උදාහරණ ලෙස බතික් සාරියක් ඇඳිය හැකි වාර ගණන ඉතා ඉහළ වන අතර පසුව එවැන්නක් බතික් ඇතිරිල්ලක්, බිත්ති සැරසිල්ලක් ලෙස ද භාවිත කළ හැකිය. මේ අයුරින් පාරිසරික බලපෑම හැකි තරම් අවම කර ගනිමින් තම ව්‍යාපාරික අරමුණු ජය ගැනීම අගය කළ යුතු ය.

තරගකාරී වෙළෙඳපොළ ප්‍රවාහය තුළ තමාට හිමි තැන තේරුම් ගන්නටත්, ඒ අනුව අනාගත ඉලක්ක තීරණය කරන්නටත් කවර ව්‍යාපාරිකයකුට වුව වෙළෙඳ ප්‍රදර්ශන ඉතා වැදගත් අවස්ථාවකි. තම මුල්ම ප්‍රදර්ශනයේදී එකම නිෂ්පාදනයක් පමණක් විකිණීමට සමත් වූ අයිරාංගනී ප්‍රදර්ශන සංවිධායක ගාස්තුව පියවන ලද්දේ අත තිබූ මුදලකිනි. එහෙත් එය අධෛර්යට කරුණක් කර නොගත් නිසාම ඇතැම් විටෙක වෙළෙඳ ප්‍රදර්ශන මඟ හැර ගන්නට ද වන තරම් ඇය බතික්කරණයෙහි කාර්යබහුලය. එමෙන්ම වෙළෙඳ ප්‍රදර්ශනවලට සහභාගි වීමෙන් ලත් අත්දැකීම්, රාජ්‍ය අනුග්‍රහයන්, සම්බන්ධතා

ඇගේ ගමනට මහත් දිරියක් වූ බව ඇය කෘතවේදීව සිහිපත් කරන්නීය. ජාතික ශිල්ප සභාව සහ රාජ්‍ය අංශයන් එක්ව සංවිධානය කළ "ශිල්ප - 2006" ප්‍රදර්ශනයට සමගාමීව පැවැත්වුණු "රුහුණු විස්කම්" පළාත් ප්‍රදර්ශනයට ඇය ඉදිරිපත් කළ බතික් නිර්මාණයට දෙවන ස්ථානය හිමිවීම ඇගේ ගමනේ විසල් සංධිස්ථානයකි. මේ අයුරින් තම හැකියා උරගා බලමින් තමාට හිමි තැන නිර්ණය කරගන්නට නිරන්තරවම උත්සාහ දැරීම ඇයගේ සාර්ථකත්වයට හේතු වූ තවත් කරුණකි.

ක්‍රීඩා, යෞවන කටයුතු, මිනිස්බල හා රැකී රක්ෂා අමාත්‍යාංශය විසින් 2006 වසරේදී සංවිධානය කළ දකුණු පළාත් ව්‍යවසායක සම්මාන ප්‍රදානෝත්සවයේදී කුඩා පරිමාණ ව්‍යාපාර අංශයෙන් පොදු කාණ්ඩයේ කුසලතා සහතිකයක් ද කාන්තා ව්‍යවසායක අංශයෙන් දෙවන ස්ථානය ද දිනා ගන්නට ෂර්මිලා බතික් වෙනුවෙන් අයිරාංගනී මහත්මිය සමත් වූවාය. ඇයගේ ව්‍යවසායකත්වයේ ගමන්මඟ තුළ රන් සලකුණු මේවා ය. බිඳෙන් බිඳ, පියෙන් පිය ඇය ආ ගමන ස්ථාවරව සවිමත් වන්නට පටන් ගන්නේ මේ කාලයේ ය. එහි වැදගත්ම සන්ධිස්ථානයක් වන්නේ බත්තරමුල්ල "අපේ ගම" පරිශ්‍රය තුළ "ෂර්මිලා බතික්" සන්නාමයට ඉඩක් වෙන්වීමය. සියලු සමාජ ස්ථරයන්ගේ බතික් ඉල්ලුම් සපුරාලමින් විවිධත්වයෙන් යුත් බතික් නිර්මාණවලින් අද ද එම කුටිය සාර්ථකව පවත්වාගෙන යන්නට ඇය සමත්ය. කළමනාකරණ හැකියාව ද, වෙළෙඳපොළ පිළිබඳ ඉව ද , නිර්මාණ කෞශල්‍යය ද යන මේ සියල්ල මනාව සංකලනය වීමට ඇය විශිෂ්ට නිදසුනකි. 2017 වර්ෂයේ දී ජාතික ශිල්ප සභාව සංවිධානය කළ දකුණු පළාත් හස්ත කර්මාන්ත ප්‍රදර්ශනයේ දී බතික් නිර්මාණ අංශයෙන් තෙවැනි ස්ථානය දිනා ගැනීම ද සුවිශේෂී කරුණකි. තරග ඉසව් වෙනුවෙන්ම කලක් තිස්සේ සැලසුම් කොට ඉදිරිපත් කරන නිර්මාණ අතර ඇගේ නිර්මාණ ඉදිරිපත් වන්නේ කාර්යබහුල ව්‍යාපාරික කටයුතු අතරතුරේදීමය.

2020 වර්ෂයේදී උද්ගත වූ කොවිඩ් වසංගතයත් සමඟ දිගින් දිගටම රට වසා තැබීමත්, සංචාරක කර්මාන්තය අඩපණ වීමත් නිසා ෂර්මිලා බතික් වෙත ද උදා වූයේ එතරම් සුබදායක කාලයක් නොවේ. තවත් අතකින් බලන විට බතික් රෙදි පිළි අත්‍යවශ්‍ය භාණ්ඩ ගණයට නොවැටීම ද ගැටලුවක් විය. බාධා ගැටලු අභිමුව නොසැලුණු ධෛර්යයකට හිමිකම් කියන අයිරාංගනී ඒ කාලයේ පැවැති නීතිරීතිවලට අවනතව ව්‍යාපාරය තාවකාලිකව වසා තැබුවාය. එහෙත් නිෂ්පාදනය හා ලාභය කොතෙක් අඩු වුවත් සේවිකාවන්ට වැටුප් ගෙවීම ඇය අතින් සිදු විය. ව්‍යාපාරය ආරම්භයේ සිටම සේවකයන්ට ETF,EPF ගෙවීම, කම්කරු නීති රෙගුලාසිවලට අවනතව ආයතනය පවත්වාගෙන යාම ඇය අතින් අකුරටම වූ නිසාදෝ සොබාදහමේ ආශීර්වාදය ඇයට නොඅඩුව ලැබිණ. කොවිඩ් වසංගතය කෙමෙන් තුරන්ව යාමත් සමඟ නව මානයකින් ව්‍යාපාර කටයුතු ආරම්භ කළ ඇයට Cinnamon Grand හෝටලයේ නුගගම පරිශ්‍රය තුළ පවා ඉඩක් වෙන් වූයේ ඒවායේ නිර්මාණාත්මක හා නිෂ්පාදන අගය ඉහළ වීම නිසාය. එසේම fashion market වැනි ප්‍රකට සන්නාමයන් වෙනුවෙන් පවා ඇය තම නිෂ්පාදන දායකත්වය ලබා දෙන්නීය. සමාජ මාධ්‍ය හා අන්තර්ජාලය සුදුසු පරිදි භාවිත කළත් ඇයට ඒ සඳහා ප්‍රචාරක නිලධාරීන්, ප්‍රචාරක කණ්ඩායම් නැත. මුදල් ගෙවා ප්‍රචාරය කිරීම් ද නැත. තමාට ඇති විශ්වසනීයම ප්‍රචාරණ මාධ්‍යය පාරිභෝගික විශ්වාසය බව ඇය පවසන්නීය. ඒ ඇයගේ ව්‍යාපාරයෙන් ඉපැයූ ඉහළම වත්කමයි. ඇයගේ නිර්මාණ වරක් මිලට ගත් අයකු දෙවැනි වර ඒ ගැන දෙවරක් නොසිතන්නේ එහෙයිනි. ඇයගේ මෙන්ම ඇයගේ අධීක්ෂණය මත ෂර්මිලා බතික්හි නිපදවෙන එකදු බතික් නිර්මාණයක හෝ අනිසි ඉටි සලකුණක්, ශේෂ ඉටි බිඳක් නැති තරම් ය. ඒ සියලු පියවරයන් ඇයගේ අවධානයට පත්වන නිසාමයි. එමෙන්ම ඇයගේ සේවිකාවන්ට වෙන්ව පැවරුණු කාර්යයන් නැත. ඒ නිසාම ඔවුහු ආයතනයේ සේවයට පැමිණ නොබෝ දිනකින්ම

සෑම පියවරක් ගැනම මනා අවබෝධයක් ලබති. ඒ අවබෝධය නිසාම ඔවුහු තමන්ගේම නිෂ්පාදන ආයතන අරඹද්දී එය කිසිදාක අයිරාංගනීට ගැටලුවක් වී නැත. තවත් කාන්තාවක් දිරියෙන් නව ගමනක් අරඹද්දී ඊට හදවතින්ම ආශීර්වාද හා උපකාර කරන්නට ඇය පැකිළෙන්නේ නැත. එසේම ආයතනයේ සෙසු සේවිකාවන් සියලු දේ ගැන මනා දැනුමින් යුත් නිසා එතරම් පාඩුවක් ද නැත. එසේම කර්මාන්තශාලා පරිශ්‍රය තුළම මනා ප්‍රායෝගික අවබෝධය ලබා දෙමින් ඇය පවත්වාගෙන යන පුහුණු පාඨමාලා, ඇය පසුපසින් විත් ව්‍යවසායකත්වයේ ජයමග සොයා යන තවත් පරපුරක් බිහි කරන්නට ඉවහල් වී ඇත.

කාන්තාවක් වීම, දරිද්‍රතාව, ස්වාභාවික ආපදා, වසංගත පීඩා, ආර්ථික කඩා වැටීම් ආදී නොයෙක් බාධා ආවත් ව්‍යාපාරයකට බාධා යනු ආශීර්වාදයක්ය යන්න තේමා කොට ගත් ෂර්මිලා බතික් වැඩබිම තුළ අදත් මනරම් ඉටි බිඳුම් මතින් චමත්කාරජනක රටා මැවෙන්නේය. දේශීය ආර්ථිකය ඉහළ නංවමින් ජාත්‍යන්තරය තුළද නම රඳවමින් යන මේ සාර්ථකත්වයේ ගමන තවත් සවිමත් වේවා!යි අපි ද ආශිංසනය කරමු.

(මෙම ලිපියේ අදහස් සහ තොරතුරුවල අයිතිය ලේඛකයා සතු වන අතර ගාමිණී කොරෙයා පදනම එම අදහස් සහ තොරතුවලට වගකියනු නොලැබේ.)

සටහන-

උදාසි මධුරංගිකා

(දකුණු පළාත)